**ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය**

**හම්බන්තොට**

***

**මාධ්‍ය නිකුතුව**

2021 ජනවාරි 21

**<u>හම්බන්තොට ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලයෙන් වැලිගත්ත මහා විද්‍යාලයට හින්දුස්තානි සංගීත භාණ්ඩ පරිත්‍යයක්</u>**

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පොදු උරුමයන් සළකා බලන විට සංගීතයට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. දකුණු පළාතේ පාසල් අතර හින්දුස්ථානි සංගීතය කෙරෙහි ඇති උනන්දුව දිගටම පවත්වා ගෙන යාමට දිරිගැන්වීම සඳහා හම්බන්තොට ඉන්දියානු කොන්සුල් ජනරාල් තුමා විසින් , නව දිල්ලියේ සංස්කෘතික කටයුතු පිළිබඳ ඉන්දියානු කවුන්සිලය වෙතින් ලබාගත් ඉන්දියානු සංගීත භාණ්ඩ රැසක් 2021 ජනවාරි 21 වන දින හම්බන්තොට වැලිගත්ත මහා විද්‍යාලයට පරිත්‍යාග කරන ලදී. මෙම සංගීත භාණ්ඩ අතර වයලීනය, සිතාර්, තබ්ලා, තන්පුර යනාදි භාණ්ඩ රැසක් ඇතුළත් විය.

02. හම්බන්තොට ඉන්දියානු කොන්සුල් ජනරාල් දිපින් පී.ආර් මහතා විසින් මෙම සංගීත භාණ්ඩ පාසලේ විදුහල්පතිතුමා හට පිළිගැන්වීය. විදුහල්පති තුමා, පාසලේ ගුරුභවතුන් සහ සිසු දරුවන් ඔවුන්ගේ සංගීත කුසලතා වර්ධනය කිරීම සඳහා ඉන්දියානු කොන්සියුලර් ජනරාල් කාර්යාලය විසින් තම පාසලට දක්වන දායකත්වය බෙහෙවින් අගය කළහ.

***